Diploma Programme
Programme du diplôme
Programa del Diploma

# Sinhalese A: literature – Standard level – Paper 1
# Singhalais A : littérature – Niveau moyen – Épreuve 1
# Singalés A: literatura – Nivel medio – Prueba 1

Wednesday 4 May 2016 (afternoon)
Mercredi 4 mai 2016 (après-midi)
Miércoles 4 de mayo de 2016 (tarde)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

### Instructions to candidates

- Do not open this examination paper until instructed to do so.
- Write a guided literary analysis on one passage only. In your answer you must address both of the guiding questions provided.
- The maximum mark for this examination paper is **[20 marks]**.

### Instructions destinées aux candidats

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Rédigez une analyse littéraire dirigée d'un seul des passages. Les deux questions d'orientation fournies doivent être traitées dans votre réponse.
- Le nombre maximum de points pour cette épreuve d'examen est de **[20 points]**.

### Instrucciones para los alumnos

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un análisis literario guiado sobre un solo pasaje. Debe abordar las dos preguntas de orientación en su respuesta.
- La puntuación máxima para esta prueba de examen es **[20 puntos]**.



2216–0179

© International Baccalaureate Organization 2016

International Baccalaureate
Baccalauréat International
Bachillerato Internacional

https://xtremepape.rs/

මෙම ඡේද අතුරෙන් **එකක්** සඳහා සාහිත්‍යමය විවරණයක් සපයන්න. පහත දක්වා ඇති උපකාරක ප්‍රශ්න දෙකට පිළිතුරු ඇතුළත් වන සේ විවරණය ඉදිරිපත් කළ යුතුයි.

**1.**

**ගම අමතකයි**

සිදදියට එන්නට මට
බුද්ධිය උඹ තමයි එද
පාර කියා දුන්නේ.
ගමෙන් උරුම වූ වස්තුව
පොදියක් බැඳ කර තියාන
උඹෙ බහට රැවටිලයි සිදදියට මං ආවේ.

ඒ එනකොට ගෙන ආ දෙය
විය පැහැදම් කළා මිසක
මෙහි දි අලුතින් ඉපයූ කිසිම දෙයක් නැත්තේ
ඉස බර කළ පුහු නම්බුව විතරයි මට ඇත්තේ

සිදදියෙන් ආපසු මගෙ
ගමට යන්න ආසයි මට
ඒත් ගමට යන්නට දැන්
පාර මතක නැත්තේ.

ඉතිරිව ඇති සුළු වස්තුව
රැකගෙන ආපසු එන්නට
ඈත ඉඳන් අත වනලා
අම්මේ මට ගමට එන්න
පාර කියා පන්නේ

බෝ මළුවේ සුදුවැල්ලේ
බෝධිය මුල දණ ගහලා
නිවන් ලබා හිත නිවන්න
අම්මේ මට ගමට එන්න පාර කියාපන්නේ

මැණික් ගඟෙන් දිය නාලා
ඇඟපත ගිනියම් දුර ලා
කිලි කුණු සෝදා හරින්න
අම්මේ මට ගමට එන්න පාර කියාපන්නේ

වල් බිහි වී ගිය හේනේ
වල් පැළ උදුරා දමලා
පැල ඉනි වැට තර කරලා
අලුතෙන් බිජුවට ඉහලා
රන් අස්වනු නෙළා ගන්න
ඈත ඉඳන් අත වනලා
අම්මේ මට ගමට එන්න පාර කියාපන්නේ

මහගමසේකර, *සක්වාලිහිණි* (1962)

https://xtremepape.rs/

(අ) කවියා විසින් උපයුක්ත පද යෝජනය හා කාව්‍ය සංස්ථිතිය පිළිබඳ විශේෂ අවධානයක් සහිතව මෙම කවි පන්තිය පිළිබද සාහිත්‍යමය රසාස්වාදනයක් සපයන්න.

(ආ) මෙම කවි පන්තියේ මුඛ්‍ය තේමාව පාඨකයාට ඉදිරිපත් කිරීමට කතුවරයා දැරූ ප්‍රයත්නය පිළිබඳව ඔබට කිව හැක්කේ කුමක්ද?



https://xtremepape.rs/

**2.**

“මං හිතන්නේ අලුතින් ගේකුත් හැදුව එක, මල්ලිලාගේ ගෙදර ගිහිල්ල ආවොත් හොඳයි. අනික අපි මේකටම වෙලා ඉන්න එකේ… පුතාටත් හොඳයි කොළඹ බලල ආවොත්…”

තාත්තා විරාමයක් දෙන්නේ අපෙන් උත්තරයක් බලාපොරොත්තුවය. මම මෙන්ම අම්මා ද පිළිතුරු ගොනුකර ගත්තෙමු. අප දෙදෙන මුහුණින් මුහුණ බලන්නේ ඉදිරිපත් වන්නා තීරණය කිරීමටය.

“අලුත් ගේකට යන එක නිකම්ම යන එක හරිද?” “අපි ඉතින් මහ තෑගි බෝග ගෙනියන්ඩයැ.” “ඔය ළමයි, බමයි කන්ඩ ආසා දෙයක් හදාගෙන යනවා මිසක්. කරත්ත මඩුව පිටිපස්සෙ කෙහෙල් කෙටියක් පැහිල තියෙන්නෙ.” අම්මා කීවාය.

“අනේ මන්ද, කෑම ටික හදාගන්ඩ නම් මැණිකෙ නැන්දටවත් අඬගහන්න වෙයි. ඔය අහල පහළ කාටත් ඕව ටික ටික දෙනවා ඇතිනෙ. පදමට ආවෙ නැත්තම් අපිටත් වැඩියෙ ඒ අයටනෙ හරි නැත්තෙ.”

“මං හිතන්නෙ ඉරිද, සෙනසුරාදාවත් අල්ල යන එක හොඳයි. මල්ලිටත් නිවාඩු දවසක් වෙන්න එපැයි.”

ගමනට දින නියමයත් සමඟ අපට රාජකාරී බහුල විය. අම්මා පිටි කෙටීම් කළමනා සුදානම් කිරීම්වල යෙදුණාය. තාත්තාත් මමත් කෙහෙල්කැන කපා වළ දැමීමට සූදානම් උනෙමු.

“අනේ මන්ද, ඕක ඉදිල වැඩි වෙයිද කියල. ඕක හෝදලා ගෙයි මුල්ලක තිබ්බ නම් යනකොට ගානට හිටියි.” අම්මා කීවාය.

උදලු මිටට බර වී කෙහෙල් කැන දෙස බලා සිටි, තාත්තා කෙහෙල් කැන වළ දමා ඇති වළට දුම් පිඹින විට පිදුරු මැත්කර ඉදී ඇද්දැයි කියා බැලිය යුතු යයි මම සිතුවෙමි.

කැවුම් උයන දිනට පෙර අම්මා අපගේ ඇඳුම් පැළඳුම් සෝදා නිල් දමා කැඩී ගිය බොත්තම් අල්ලා ඉස්තිරික්ක කළාය. මම සපත්තු සෝදා පවිත්‍ර කොට සූදානම් කළෙමි.

සිකුරාදා සවස් වන විට සියලුම කටයුතු නිමාවී තිබුණි. එදින රාත්‍රී කෑම කෑවේත් නින්දට යන තුරු කතා බහ කළේත් ගමන ගැනයි.

ගෙන යා යුතු දෑ විශාල විය. කෑම පීම් හැරුන විට හාල් පොල් එළවලු – කරපිංචා පවා විය.

“ලෑස්ති කළා වගේ නෙමේ ගෙනියන්ඩ ගියහමයි රුදාව තේරෙන්නෙ.”

“හැමදාම යන එකක්යැ. මහන්සි කරදර බලල පුළුවන් ද?”

අපි ගමන පාන්දරින් පිටත්විය යුතු නිසා වේලාසන නින්දට ගියෙමු. මෙතරම් පවිත්‍ර සියුම් හැඟීමක් මසිත මෙතෙක් පටලැවී නැත. සිසිලසත් අන්ධකාරයත් සමග ඇරඹෙන සියලු ප්‍රාණීන්ගේ නාද එකිනෙක වෙන්ව මගේ දෙකන් තුළට රිංගන්නාසේ මට දැනුණි. බසයෙන් වටපිටාව දකිමින් දිගු ගමනක් යෑම, බාප්පලාගේ ගෙදර අක්කා සහ මල්ලි සමග සෙල්ලම් කිරීම් ආදිය සිහිකරත්ම සතුටකින් සිත පිරීයන්ට විය. දීර්ඝ කාලයකින් ඔවුන් නොදැක ඔවුන්ට මා අමතක වි ඇත්දැයි යන සිතුවිල්ල එම මොහොතේ මගේ සිතට ආවේය.

සෝමරත්න බාලසූරිය, *කරත්තය* (1991)

(අ) ජේදයේ ප්‍රධාන තේමාවන් ගෙන ඒමට කතුවරයා දරා ඇති ප්‍රයත්නය පිළිබඳව අදහස් දක්වන්න.

(ආ) කතුවරයා යොදා ගෙන ඇති ආඛ්‍යාන ශෛලිය හා රචන උපක්‍රම පිළිබඳව ඔබට කිවහැක්කේ කුමක්ද?

https://xtremepape.rs/